# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
## (බාහිර) - 2008

### මානවශාස්ත්‍ර පීඨය

### බෞද්ධ දර්ශනය -BUPH- E1025

### මූලාශ්‍රය අධ්‍යයනය හා ආදි බෞද්ධ නිකාය

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි

කාලය : පැය 03 යි

01. සාමඤ්ඤඵල සූත්‍රය ද ඇසුරු කරගනිමින් බුද්ධකාලීන භාරතීය අකිරියවාදී ඉගැන්වීම් පිළිබඳ විමසුමක් කරන්න.

02. ''නොකළ යුත්ත මෙන්ම කළ යුත්තද උගන්වන බෞද්ධ ශීල ශික්ෂාව මානසික සංවර්ධනයේ පදනමයි.'' විමසන්න.

03. පටිච්ච සමුප්පාද ධර්මයෙහි මූලික අරමුණු කවරේදැයි මහා නිදාන සූත්‍රය ඇසුරින් සාකච්ඡා කරන්න.

04. මධුපිණ්ඩික සූත්‍රයෙහි එන සවැදෑරුම් විඤ්ඤාණයන් හා ප්‍රත්‍ය ධර්මයන් පෙන්වා දෙමින් ඒවා සසර දුකට තුඩුදෙන ආකාරය පරීක්ෂා කරන්න.

05. ''ලෝකය බෙහෙවින්ම ද්වය නිශ්‍රිතය'' යන්න පැහැදිලි කරමින් එහිලා බුදුසමය කවර මගක යන්නේදැයි කච්චානගොත්ත සූත්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.

06. නිකායාන්තර මතභේදයන්ගේ සම්භවයට තුඩුදුන්නේ යැයි සැලකෙන විවිධ හේතු සාධක පිළිබඳ විමසුමක් කරන්න.

07. ''ථෙරවාද බෞද්ධ ගුරුකුලය වූකලී විනය සම්ප්‍රදායයක් මිස අන් යමක් නොවේ.'' අදාළ මූලාශ්‍රය අනුව පරීක්ෂා කරන්න.

08. බුදුරදුන් පිළිබඳ මහා සංඝික මතය පාලි නිකායාගත තොරතුරු සමග තුලනාත්මකව සාකච්ඡා කරන්න.

09. පුද්ගල සංකල්පය පිළිබඳව සර්වාස්තිවාදීන් හා පුද්ගලවාදීන් අතර පැවති පිළිගැනීම් සංසන්දනාත්මකව විමර්ශනය කරන්න.

10. සෞත්‍රාන්තික ගුරුකුලය පිළිබඳ මූලික හැඳින්වීමක් කරමින් එහි දක්වෙන ක්ෂණමාත්‍රතා සංකල්පය පැහැදිලි කරන්න.

***************************